

# 1990 වසරේ සිට ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රියා විරහිත වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (කෝප්) 2005 වාර්තාව 'ඇස් විවෘත කිරීමක්' ද ?




## ගනු ලැබූ ප්‍රති ක්‍රියාමාර්ග මොනවාද ?

"විගණකාධිපතිවරයා සහ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව ඔවුන්ගේ වාර්තාවල පහත කරුණු ඉස්මතු කර ඇත ....."

"රටට ලැබෙන අපනයන ආදායම් ප්‍රේෂණයන් සහ රටට අහිමි වන විදේශ විනිමය පිළිබඳ අධීක්ෂණයක් බැංකුව නොකළ නිසා, අපනයන ඉපැයුම් ප්‍රේෂණයන්හි අඩු වීමක් සිදු වී තිබේ. "

"ඔබ කාරක සභාවෙහි පොදු නිරීක්ෂන පහත දැක්වේ"

"අපනයන ප්‍රේෂණයන් පිළිබඳ නිසි අධීක්ෂණයක් නොමැතිකම හේතුවෙන් රටෙහි බාහිර සම්පත් ක්ෂය වෙමින් පවතින වකවානුවක අපනයන අදායම් පූර්ණ ලෙස ශ්‍රී ලංකාව තුලට නොපැමිණීම."

**විනිමය පාලකයේ බලය ඉවත් කිරීමේ පහත ගැසට් පත්‍රයට හේතු වූයේ කවුද ?**

**1993.3.25 දිනැති නියෝගය - ගැසට් අංක 759/15**

"1973 අංක 39 දරන විනිමය පාලන (සංශෝධන) නීතිය මගින් සංශෝධිත 1953 අංක 24 දරන විනිමය පාලන පනතේ 22 (4) වගන්තියේ විධි විධාන වලින්, ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන භාණ්ඩ සඳහා ගෙවීම සම්බන්ධයෙන් නිදහස් කර ඇත."

**1994.3.29 දිනැති නියෝගය - ගැසට් අංක 813/14**

"විනිමය පාලන පනතේ 22 (3) වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මුදල් අමාත්‍යවරයා විසින් 1975.10.27 දින අංක 187/2 දරන ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය මෙයින් අවලංගු කෙරේ."

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

## හයවැනි පාර්ලිමේන්තුවේ

(පළමුවන සැසිවාරය)

# පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා

## අංක 06

### පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දෙවැනි වාර්තාව

ඉදිරිපත් කරන ලද්දේ

ගරු සභාපති සහ උසස් තාක්ෂණ සහ ජාතික ව්‍යවසාය සංවර්ධන අමාත්‍ය

පාර්ලිමේන්තු මන්ත්‍රී රෝහිත බෝගොල්ලාගම මහතා විසිනි

මුද්‍රණය කිරීමට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියම කරන ලද්දේ
**2005 ජූනි මස 22 වැනි බදාදා**

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබා ගත හැක.

මිළ: රු. 32.25 තැපැල් ගාස්තුව: රු. 10.00

## පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව
## හයවැනි පාර්ලිමේන්තුවේ පළමු සැසිවාරය
## (2004 සැප්තැම්බර් මස 09 වන දින නම් කරන ලදී)

ගරු රෝහිත බෝගොල්ලාගම මහතා, පා.ම. (සභාපති)

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා පා.ම.

ගරු ඩිලාන් පෙරේරා මහතා, පා.ම.

ගරු ශ්‍රීපති සූරියආරච්චි මහතා, පා.ම.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා, පා.ම.

ගරු ෆයිසර් මුස්තාපා මහතා, පා.ම.

ජෝන් අමරතුංග මහතා, පා.ම.

රවි කරුණානායක මහතා, පා.ම.

කෙහෙලිය රඹුක්වැල්ල මහතා, පා.ම.

මර්වින් සිල්වා මහතා, පා.ම.

මාවෙ එස්. සේනාධිරාජා මහතා, පා.ම.

එච්. ආර්. මිත්‍රපාල මහතා, පා.ම.

ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා, පා.ම.

සේනාධිරාජා ජෙයනන්දමූර්ති මහතා, පා.ම.

පූජ්‍ය අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ, පා.ම.

පියසිරි විජේනායක මහතා, පා.ම.

හසන් අලි මහතා, පා.ම.

විජයදාස රාජපක්ෂ මහතා, පා.ම.

# පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දෙවැනි වාර්තාව

## (ශ්‍රී ලංකා මහ බැංකුව පිළිබඳ වාර්තාව)

### හයවැනි පාර්ලිමේන්තුවේ පළමු සැසිවාරය

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව එහි හයවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි වාර්තාව ඉදිරිපත් කරන්නේ සතුටිනි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ල. ම. බැ.) කාර්යසාධනය සහ වත්මන් කටයුතු පිළිබඳ ඔබගේ කමිටුවේ පරීක්ෂණය තුළින් මතුවන නිරීක්ෂණ සහ නිර්දේශ මෙම වාර්තාවේ ඇතුළත්වේ.

ඔබගේ කමිටුව විසින් රැස්වීම් 07 කදී පැවති සවිස්තර පරීක්ෂණයකින් ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය සමාගම් අධීක්ෂණය කිරීම, බැංකු අධීක්ෂණය සහ බැංකු අවසරපත් නිකුත් කිරීම සහ සාමාන්‍ය මූල්‍ය කාර්යසාධනය පරීක්ෂාවට ලක්කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව වගකීම් එහි සම ව්‍යාපාර සම්බන්ධ කාර්යසාධනයේ ගුණාත්මක බව, රටට නිසි බැංකු සහ මූල්‍යමය වගකීම් පවත්වාගෙන යෑම සමග බැඳුණු වගකීම් මෙම වාර්තාවේ දී පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් සැලකිල්ලට ලක්කරන ලදී.

මෙම වාර්තාව මූලික වශයෙන් සැලකිල්ල යොමු කරන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව සහ බැංකු ණය සපයන ආයතන අධීක්ෂණය කිරීමේදී එහි ක්‍රියාකාරිත්වය සහ වගකීම් හා බැඳුනු අපගමනයන්, උල්ලංඝනය කිරීම් සහ විධිමත් වගකීම නොමැති වීම යනාදී මුඛ්‍ය අංශයන් කෙරෙහිය. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව තම වගකීම් ඉටු කිරීමට අසමත්වූ බැංකු සහ ණය ආයතනයන්හි පහත සඳහන් ක්ෂේත්‍ර ඔබගේ කමිටුව හඳුනාගෙන තිබේ.

1. මූල්‍ය ව්‍යාපාරයේ යෙදෙන සමාගම් ගැන විධිමත් සුපරීක්ෂණයක් නොමැති වීම.
2. බැංකු අවසරපත් නිකුත් කිරීමේදි නිසි අවබෝධයකින් ක්‍රියාකිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව අසමත්වීම නිසා මූල්‍ය ව්‍යාපාරවලදී අසාර්ථකවූ සමාගම් හා සම්බන්ධ පුද්ගලයින්ටම ඒවා ලබාදී තිබීම.
3. එවැනි මූල්‍ය සමාගම් වලට ලබාදුන් අත්තිකාරම් නිසි කලට ආපසු අයකර ගැනීමට අපොහොසත් වීම.
4. එවැනි අසාර්ථක වීම්වලට වගකිවයුතු පුද්ගලයින් සම්බන්ධයෙන් සුදුසු පියවර අනුගමනය කිරීමට සහ ක්‍රියාකිරීමට සහ ඒ සම්බන්ධ නිසි නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට අපොහොසත් වීම.
5. තම යටතට ගැනෙන මූල්‍ය සමාගම් වල පරිපාලනය සහ කළමණාකරනය පිළිබඳව දියයුතු අවධානය යොමුකිරීමට නොහැකිවීම.

ශ්‍රී ලංකා මහ බැංකුවේ කළමනාකාරිත්ව ඌනතා සහිත අංශ කීපයක් කමිටුව විසින් පරීක්ෂාවට ලක්කර ඇති අතර ඉහත සඳහන් ක්ෂේත්‍රවලට අදාලව ඒවා පහත සඳහන් පරිදි ගොනුකර දැක්වීමට කැමැත්තෙමු. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සැලකිය යුතු තරමේ මූල්‍ය ආයෝජනයක් කර තිබෙන මූල්‍ය ව්‍යාපාරයේ නියුතු සමාගම් වෙතද අපගේ වැඩිදුර අවධානය යොමු කළෙමු.

## මූල්‍ය සමාගම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණය

1988 සිට 1994 දක්වා ප්‍රතිමූල්‍ය පහසුකම් ලබාදී තිබූ, ආපසු ගෙවීම පැහැරහරින ලද මූල්‍ය සමාගම් 13 වෙතින් ඒවා ආපසු අයකර ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව අපොහොසත්ව ඇති බව ඔබ කමිටුව නිරීක්ෂණය කර ඇත. මෙම සමාගම් වලට ලබාදී තිබෙන මුළු අත්තිකාරම් රු. බිලියන 2.7 වන අතර 2004 දෙසැම්බර් 31 වැනි දිනට මුළු හිඟ ශේෂය රු. බිලියන 7.3කි. එය පහත සඳහන් පරිදි වේ:

| සමාගමේ නම | ලබාදුන් ණය/ අත්තිකාරම් රු. බිලි. | 2004.12.31 දක්වා ආපසු අයකර ගැනීම රු. බිලි. | 2004.12.31 දක්වා නියමිත පොළිය රු. බිලි. | මුළු හිඟ ශේෂය රු. බිලි. |
|---|---|---|---|---|
| මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් | 1.7 | 0.1 | 3.1 | 4.7 |
| යූනියන් ට්‍රස්ට් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් | 0.3 | – | 0.4 | 0.7 |
| හවුස් ඇන්ඩ් ප්‍රොපර්ටි ට්‍රේඩර්ස් ලිමිටඩ් | 0.3 | – | 0.3 | 0.6 |
| ට්‍රාන්ස්ලංකා ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් | 0.2 | – | 0.2 | 0.4 |
| හෝම් ෆිනෑන්ස් ලිමිටඩ් | 0.1 | 0.1 | 0.1 | 0.1 |
| වෙනත් | 0.1 | – | 0.7 | 0.8 |
| එකතුව | 2.7 | 0.2 | 4.8 | 7.3 |

මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් සමාගමට පමණක් (එම්.සී. එල්.) ලබාදී තිබූ අත්තිකාරම් මුදල රු. බිලියන 1.7ක් (ලබාදුන් මුළු අත්තිකාරම වලින් 63%) වූ හෙයින් සහ 2004 දෙසැම්බර් 31 වැනි දිනට හිඟ අගය රු. බිලියන 4.7ක් (මුළු හිඟ අගයෙන් 64%) වූ හෙයින් කාරක සභාව මේ සම්බන්ධයෙන් සවිස්තර සමාලෝචනයක් කළේය.

පරීක්ෂණයේදී ඔබ කාරක සභාව පහත සඳහන් කරුණු සටහන්කර තිබුණි:

* 1956 ජූලි 4 වැනි දින සීමාසහිත සමාගමක් වශයෙන් සංස්ථාපනය කරන ලදුව එම්.සී.එල්. 1957 ජනවාරි 23 වැනි දින පොදු සමාගමක් බවට පරිවර්තනය කරන ලද එම්.සී.එල්. සමාගම, 1979 අංක 27 දරන මූල්‍ය සමාගම් පාලන පනත යටතේ 1980 නොවැම්බර් 27 වැනි දින මූල්‍ය සමාගමක් වශයෙන් ලියාපදිංචි කරන ලදී. 1988 අංක 78 දරන නව මුදල් සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද එයට 1990 නොවැම්බර් 6 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මූල්‍ය ව්‍යාපාර කටයුතු වල යෙදීමට බලපත්‍රයක් නිකුත් කරන ලදී.

* 1990 නොවැම්බරයේ සිට දරුණු ද්‍රවශීලතා ගැටළුවලට මුහුණදුන් එම්.සී.එල්. ආණ්ඩුවෙන් ප්‍රතිමූල්‍ය පහසුකම් ඉල්ලා සිටියේ ය.

* ණය ආයතනය මගින් නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටු මත 1991 - 2000 දක්වා එම්.සී.එල්. වෙත රු. මිලියන 1,742ක් ශ්‍රී ල. ම. බැ. විසින් ප්‍රතිමූල්‍ය / සෘජු ණය පහසුකම් වශයෙන් ලබා දී තිබූ අතර මුදල් නීති පනත යටතේ මධ්‍ය සහ දිගු කාලීන ණය අරමුදල් ණය විධිවිධාන යටතේ අවශ්‍ය ප්‍රතිමූල්‍ය පහසුකම් ලබාදුන් ණය අනුයුක්ත කරන ලදී.

* මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් විගණන පරීක්ෂණයක් සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 1991 ජනවාරි 01 දින පත් කරන ලද කූපර්ස් ඇන්ඩ් ලයිබ්‍රෑන්ඩ් ඇසෝසියේට්ස් (C&L) ආයතනය, මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් ආයතනය මූල්‍ය කාර්ය සාධනය සම්බන්ධයෙන් බලපෑ ආකාරයත්, ගිණුම් මූලධර්ම කිහිපයක් උල්ලංඝනය කරමින් එම්. සී. එල්. සමාගම යහපත් වූ මූල්‍ය ව්‍යුහයක් මවා පෙන්වා ඇති ආකාරයත් පැහැදිලි කරමින් 1991 ජූලි මස විස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කළ බව ඔබේ කාරක සභාවේ අවධානයට ලක්විය.

* මෙම සවිස්තරාත්මක වාර්තාව 1991 ජූලි මස වනවිට නිකුත් වී තිබියදී හා ඉතාමත් ඉක්මනින් ක්‍රියා කළ යුතු ආකාරයේ බරපතල අඩුපාඩු පෙන්වා තිබියදීත් මුදල් මණ්ඩලය විසින් 1992 පෙබරවාරි මස දක්වා ක්‍රියා මාර්ගයක් ගත් බවක් නොපෙනේ.

* ඔබගේ කාරක සභාවේ අදහස වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව අදාළ ව්‍යවස්ථා යටතේ බලාපොරොත්තු වූ පරිදි මුදල් සමාගම් පාලනය කිරීම සම්බන්ධයෙන් තම වගකීම ඉටුකර නොමැති බවයි.

* ද්‍රවශීලතා අවශ්‍යතා පැනවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව බෙහෙවින් නම්‍යශීලී වී තිබේ.

* 1979 අංක 27 දරන මුදල් සමාගම් පාලන පනත හා 1988 අංක 78 දරන පනතට අනුව ශ්‍රී ලංකා මහ බැංකුව, බැංකු නොවන මූල්‍ය ආයතන පාලනය කිරීම හා විධිමත් කිරීම කළ යුතු අතර තැන්පත්කරුවන්ගේ පොළී ආරක්ෂා කිරීම හා ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා එවන් ආයතන වල ද්‍රවශීලතාව හා ණය ගෙවිය හැකි බව සහතික කිරීමද කළ යුතුයි.

* 1982 ජූනි 24 දින අංක 198/9 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින්, පරිපාලිත සමාගම්වලට ණය හා අත්තිකාරම් දීම මුදල් සමාගම්වලට තහනම් කරනු ලැබුවද, අප වෙත ඉදිරියේ කරන ලද කරුණු වලින් තහවුරු වන පරිදි අදාළ ආයතන වලට එවන් ණය සහ අත්තිකාරම් ප්‍රදානය කිරීම වැළැක්වීමට ශ්‍රී ලංකා මහ බැංකුව අසමත් වී ඇත.

* ප්‍රීමියර් මැනේජ්මන්ට්ස් ලිමිටඩ් ආයතනය නීතිමය ආකාරයට මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් හි පරිපාලිත සමාගමක් නොවූනත්, පහත සඳහන් හේතු අනුව මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් හි පරිපාලිතයක් ලෙස සැලකිය හැකියැයි III වන තත්ව වාර්තාවේ, කූපර්ස් ඇන්ඩ් ලයි බ්‍රෑන්ඩ් ආයතනය සිය පරීක්ෂණයේ දී සඳහන් කොට තිබේ.

    • ඒ. එස්. ඉලංගකෝන් මහතා තම නමට ලියාපදිංචි කර ඇති කොටස් 9,994 (මෙය නිකුත් කොට ඇති කොටස් 10,000 කිනි) ඇලයිඩ් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් වෙනුවෙන් තබාගන සිටියි. අනෙක් කොටස් 6 මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් හි හවුල්කාර සමාගමක් වන ඇලයිඩ් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් හි සහ මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් හි වර්තමාන හෝ අතීත අධ්‍යක්ෂකවරුන් සතුව ඇත.

    • මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් හි සභාපති වන නිහාල් ජයවර්ධන මහතා ප්‍රීමියර් මැනේජ්මන්ට්ස් ලිමිටඩ් සතු පරිපාලිත සමාගම් 21න් 19 කම අධ්‍යක්ෂ තනතුර දරයි.

    • නීලියා පෙරේරා මහත්මිය (මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් හි සභාපති වන එන්. යූ. ජයවර්ධන මහතාගේ දියණිය) ප්‍රීමියර් මැනේජ්මන්ට්ස් ලිමිටඩ්හි පරිපාලිත සමාගම් 13 ක අධ්‍යක්ෂකවරියක වේ.

    • මිලින්ද මොරගොඩ මහතා (නීලියා පෙරේරා මහත්මියගේ පුත්‍රයා) ප්‍රීමියර් මැනේජ්මන්ට්ස් ලිමිටඩ් හි පරිපාලිත සමාගම් 13 ක අධ්‍යක්ෂකවරයකු වේ.

    • නිහාල් ජයවර්ධන මහතා, නීලියා පෙරේරා මහත්මිය හා මිලින්ද මොරගොඩ මහතා ප්‍රීමියර් මැනේජ්මන්ට්ස් ලිමිටඩ් හා මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් හි අධ්‍යක්ෂවරු වෙති.

- 1989 මාර්තු 31 දින වන විට පරිපාලිත සමාගම් 21 හි නිකුත් කොට ඇති මුලු කොටස් ප්‍රාග්ධනය පහත සැරිදි වේ.

| | | |
|---|---|---|
| සාමාන්‍ය කොටස් | රු. | 9,652,000 |
| ධාරණීය කොටස් | රු. | 19,500,000 |
| | රු. | 29,152,000 |

- මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් ආයතනය 1990 මාර්තු 31 දිනට මෙම සමාගම් වලට සෘජුවම ප්‍රදානය කර ඇති ණය සහ අත්තිකාරම් ප්‍රමාණය රු. මිලියන 124 ක් වන අතර ප්‍රිමියර් මැනේජ්මන්ට්ස් ලිමිටඩ් මගින් මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් වෙත ප්‍රදානය කර ඇති ණය හා අත්තිකාරම් ප්‍රමාණය රු. මිලියන 33කි. මේ නිසා මේ සමාගම්වලට මූල්‍ය සම්පාදනය සිදු වනුයේ මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් ආයතනය විසිනි.

- 1991 ජනවාරි 23 දිනැති ඔවුන්ගේ වාර්තාවේ පැහැදිලි කරන ලද ආකාරයට ප්‍රිමියර් මැනේජ්මන්ට්ස් ලිමිටඩ් හි ලියාපදිංචි කාර්යාලය මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් හි ලියාපදිංචි කළ කාර්යාලය ම වේ.

- ප්‍රිමියර් මැනේජ්මන්ට් ලිමිටඩ් හි පරිපාලිත සමාගම් 25 ම එම ලිපිනයෙහි ලියාපදිංචි කොට ඇත.

* ප්‍රිමියර් මැනේජ්මන්ට් ලිමිටඩ් මගින් පරිපාලිත සමාගම් 25 පාලනය කරන මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් ආයතනයට ණය හා අත්තිකාරම් වශයෙන් අරමුදල් පැවරීමට ඉඩදීම ශ්‍රී ලංකා මහ බැංකුව පාර්ශවයෙන් වූ බරපතල අඩුපාඩුවක් බව ඉහත කරුණෙන් පැහැදිලි වේ.

* කූපර්ස් ඇන්ඩ් ලයිබ්‍රෑන්ඩ් ආයතනයේ පරීක්ෂණ වාර්තාව ලැබුණ පසුව වුවද, ප්‍රිමියර් මැනේජ්මන්ට්ස් ලිමිටඩ් ආයතනයේ ක්‍රියාකාරකම් කෙරෙහි පාලනයක් ඇති කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව අසමත් වී තිබේ.

තවද මර්කන්ටයිල් ක්‍රෙඩිට් ආයතනයේ මූල්‍යමය තත්ත්වය හා ප්‍රතිඵල වල විකෘති තත්ත්වයේ බැරෑරුම්කම අවධාරනය කිරීම සඳහා, C & L වාර්තාවේ පහත සඳහන් කරුණු නැවත දක්වනු ලැබේ.

* කල්බදු මිලදී ගැනීම් හා කුලියට ගැනීමේ ආදායම කල් පිරීමට පෙර හා අසාධාරණ ලෙස හඳුනාගැනීම මගින් 1990 මාර්තු 31 දිනට රඳවා තබාගත් ලාභය හා ණය ගැතියන් අඩු වශයෙන් රු. මිලියන 108 කින් පමණ වැඩිපුර දක්වා ඇත.

* 1990 මාර්තු 31 දිනට ඇස්තමේන්තුගත බොල් හා අවිනිශ්චිත ණය ප්‍රතිපාදන යටතේ දක්වා ඇති ප්‍රමාණය රුපියල් මිලියන 285කි.

* 1990 මාර්තු 31 දිනට සමාගමේ ශුද්ධ වටිනාකම රුපියල් මිලියන 273 සිට රු. මිලියන 124 වන සෘණ අගයක් දක්වා අඩුවිය.

* මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් හි පරිපාලිත සමාගම්වල ශුද්ධ සමුච්චිත පාඩුව වන රුපියල් මිලියන 149 සඳහා මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් හි අත්තිකාරම් මගින් අරමුදල් සපයා ඇත.

* මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් සමාගම, රු. මිලියන 182ක් ප්‍රිමියර් මැනේජ්මන්ට්ස් ලිමිටඩ් හා එහි පරිපාලිතයන් හි ආයෝජනය කර ඇත.

* ප්‍රිමියර් මැනේජ්මන්ට්ස් ලිමිටඩ් හි හා එහි පරිපාලිත සමාගම්වල ගිණුම් මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් ආයතනයේ හා එහි පරිපාලිත වල සමූහ ගිණුම් සමග ඒකාබද්ධ කළහොත් ඒකාබද්ධ කොටස් ප්‍රාග්ධනය සහ සංචිත දළ වශයෙන් රු. මිලියන 150 කින් පමණ පහත බසිනු ඇත.

  * සම්බන්ධ සමාගම්වල පාඩුව, විගණන ගිණුම් වල වාර්තා වී තිබුණ ප්‍රමාණයට වඩා විශාල ප්‍රමාණයකි.
  * මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් විසින් පිහිටුවන ලද ව්‍යාපාර ආයතන, මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් හි නෛතික වශයෙන් අනුබද්ධ ආයතනයක් නොවන එහෙත් හරයාත්මක වශයෙන් මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටිහි පරිපාලිත සමාගමක් ලෙස සළකනු ලබන ප්‍රීමියර් මැනේජ්මන්ට් ලිමිටඩ් හි පරිපාලිත සමාගම් වශයෙන් මාරු කරනු ලැබ තිබෙන බව වාර්තාවෙන් අවධාරණය කරනු ලැබිණ.

- ➢ ප්‍රිමියර් මැනේජ්මන්ට්ස් ලිමිටඩ් නමැති ආධාරකය මාර්ගයෙන් මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ්හි අධ්‍යක්ෂවරුන් සමාගම් 25 පාලනය කළ අතර ඔවුහු ඒවායේ ක්‍රියාකාරිත්වය හා කටයුතු පිළිබඳව සැළකිය යුතු බලපෑමක් ඇති කළහ. මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් ආයතනය මෙම සමාගම්වල මුදල් ආයෝජනය කිරීම හා අත්තිකාරම් දීම සිදු කරමින් සිටි අතර ඒ සියල්ලම පාඩු ලබමින් සිටීම මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් ආයතනයේ උග්‍ර ද්‍රවශීලතා ගැටළුවලට දායක වී තිබේ.

- ➢ වාර්තාව අනුව, මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් ආයතනය 1990 මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය මත 25% මධ්‍යස්ථ අගයකට ලාභාංශ ප්‍රකාශයට පත්කොට ඇති නමුත් ඇත්ත වශයෙන් ම බංකොලොත්භාවයකට තුඩුදෙන මූල්‍යමය පාඩුවක් එහි දක්නට ලැබිණ.

- ➢ වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයක් වන අර්නස්ට් ඇන්ඩ් යංග් සමාගම, මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් හි විගණකවරුන් වශයෙන් කටයුතු කිරීම නිසා විකෘති ලෙස දක්වන ලද එකී සමාගමේ මූල්‍යමය ප්‍රතිඵල හා මූල්‍යමය තත්ත්වය අවධාරණය නොකිරීමෙන්, ඇතිවිය හැකි වස්තු භංගත්වය පිළිබඳ පූර්ව දැනුම්දීමක් සිදු නොකිරීම හේතු කොටගෙන මෙම අඩුපාඩු පෙන්වාදීමට අපොහොසත් වී ඇති බව ද කාරක සභාව සිය දැඩි අවධානයට ලක් කළේය. මෙම ගිණුම් පරීක්ෂා කිරීමේ දී වඩා අර්ථාන්විත ආකාරයකින් සිය විනිශ්චයදීම ශ්‍රී ලංකා මහ බැංකුව මගහැර ඇති අතර එසේ කළේ නම් මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් ආයතනයේ ගෙවීම පැහැර හැරි මූල්‍යමය තත්ත්වයෙන් මෙය උද්ගත විය හැකිව තිබූ වස්තු භංගත්වය වැළැක්වීමේ තත්ත්වයකට එය පත් කළ හැකිව තිබුණි. එහි ප්‍රතිඵලය වූයේ අහිංසක තැන්පත්කරුවන් මර්කන්ටයිල් ක්‍රෙඩිට් ආයතනය වස්තු භංගත්වයට පත්වෙමින් පවතිද්දී එහි අනාගතය පිළිබඳ නොදැනුවත්කමින් සැළකිය යුතු ප්‍රමාණයන්ගෙන් මුදල් තැන්පත් කිරීමයි.

- ➢ පවරා ගනු ලැබීමෙන් ඉක්බිතිවම (1992 මාර්තු 31 දිනට) මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ්හි ශුද්ධ වත්කම් ප්‍රමාණය රු. මි. 272 ක සෘණ අගයක් ගත් අතර ප්‍රධාන වශයෙන් ම පරිපාලන හා පොලී වියදම් නිසා 2005 මාර්තු 31 වන විට එය රු. බිලියන 5.8 ක් දක්වා පහත වැටී තිබුණි.

- ➢ ඒ හැරුණු විට ශ්‍රී ලංකා මහ බැංකුව මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් ආයතනයේ මූල්‍යමය තත්ත්වය හා මූල්‍යමය ප්‍රතිඵල නිරන්තර සමාලෝචනයකට ලක් කර නොතිබූ බව ද අනාවරණය විය.

  * 1991 අප්‍රේල් මස 01 වන දිනට මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් හි ගිණුම් වල ආරම්භක ශේෂයන්හි නිරවද්‍යතාවය පිළිබඳ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුව භාරගෙන නොතිබිණි. මර්කන්ටයිල් ක්‍රෙඩිට් හි පසු වර්ෂවල ගිණුම් සම්බන්ධයෙන් ද මෙම තත්ත්වය දක්නට තිබිණි.
  * මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ්හි 1998 / 1999 සිට 1999 / 2000 දක්වා කෙටුම්පත් ගිණුම් හි අවසන් පිළියෙළ කිරීම් මුදල් මණ්ඩලයේ අනුමැතිය සඳහා යොමු කොට ඇත්තේ 2004 ඔක්තෝබර් 05 වනදා ය.
  * 1999 / 2000 වසරින් පසු අවසන් ගිණුම් හෝ අවසන් කෙටුම්පත් ගිණුම් පවා මුදල් මණ්ඩලයේ අනුමැතිය සඳහා යොමු කොට නොමැත.

- මෙය ඵලදායි ලෙස සිදුකොට ඈවර කිරීමේ ක්‍රියාවලිය අවසන් කොට මේ ප්‍රමාණයට වත්කම් පදනම ක්ෂයවීම වළක්වා ගත හැකිව තිබුණි.

- මර්කන්ටයිල් ක්‍රෙඩිට් ආයතනයේ ණයගැතියන්ට එරෙහිව දැනට අධිකරණය ඉදිරියේ ඇති නඩු නිසි පසු විපරමකට ලක්කොට නොමැති හෙයින් සැළකිය යුතු පරිදි අයකර ගැනීම් සිදුකොට අවසානයකට ළඟාවීමට නොහැකි වී තිබුණි.

- පොරොන්දු පත්‍ර ආකාරයෙන් ලබාගත් සමපාර්ශ්වික ඇප පවා නියමිත වේලාවට මුදල් කර නොමැත. මේවායින් බොහොමයක් 1996 ජනවාරි මාසයේ දී ශ්‍රී ලංකා මහ බැංකු බෝම්බ ප්‍රහාරයෙන් විනාශ වූ ඒවා වශයෙන් වාර්තා කරනු ලැබ තිබේ.

- සැළකියයුතු ණය ක්‍රියාමාර්ග හා ආපසු අයකර ගැනීම් සඳහා පවත්නා අදාළ කරුණු ලබාගැනීමේ පරමාර්ථය උදෙසා මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් හා පී. එම්. එල්. යන පරිපාලිත සමාගම් මගින් ගිණුම් ප්‍රති සැකසීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව කිසිදු මූලික ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.

- 1992 පෙබරවාරි 06 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම මූල්‍ය සමාගමේ පරිපාලනය හා කළමනාකරණය මුදල් මණ්ඩලයේ පාලනය යටතට පත්කරන ලදී. මර්කන්ටයිල් ක්‍රෙඩිට් සමාගමේ කටයුතු ඵලදායි ලෙස කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය ප්‍රමාණවත් පියවර ගෙන නොතිබිණි.

- මර්කන්ටයිල් ක්‍රෙඩිට් සමාගම ශක්තිමත් සහ ණය ගෙවිය හැකි ආයතනයක් බවට පත් කිරීමට අපොහොසත් වූ ශ්‍රී ලංකා මහ බැංකුව, 1993 සැප්තැම්බර් මස 07 වන දින එහි කටයුතු අවසන් කිරීමට තීරණය කළේය.

- 1993 වසරේ දී සමාගම ඈවර කිරීමට තීරණය කරනු ලැබුව ද, ඈවර කිරීමේ පෙත්සම ගොනුකරන ලද්දේ 2005 අප්‍රේල් 29 වනදාය. මෙම පෙත්සම නියමිත කාලය තුළදී ගොනු කරන ලදුව ඒ හා අදාළ පසු විපරම් කටයුතු ඵලදායි ලෙස ඉදිරියට කර ගෙන යනු ලැබුවේ නම් සැළකිය යුතු මුදල් ප්‍රමාණයක් අය කර ගනු හැකිව තිබුණි.

- මීට අමතරව, 1993 දී ඈවර කිරීමට නීතිමය පියවර ගත් අවස්ථාවේදී, මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් සමාගම බුන්වත් භාවය කරා යමින් තිබියදී මහජනතාවගෙන් තැන්පතු ලබාගැනීම සම්බන්ධයෙන් කලින් අවස්ථාවේදී අධ්‍යක්ෂවරුන්ට එරෙහිව, ශ්‍රී ලං. ම. බැං. විසින් පවරා ගනු ලබන අවස්ථාවේ කටයුතු කිරීමට එයට හිමිකම ලැබිය යුතුව තිබුණි.

- මෙය මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් හි කටයුතු හැසිරවීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුව බරපතල ලෙස අසාර්ථකවීම පිළිබඳ පැහැදිලි උදාහරණයකි.

- සමාගම විසින් ලබාදුන් මුළු අත්තිකාරම් ප්‍රමාණය වන රුපියල් බිලියන 1.7න් මේ දක්වා නැවත අය කර ගෙන ඇත්තේ රු. මිලියන 121.4 ක් පමණි. මුළු මුදල් ප්‍රමාණයෙන් 7% ක් වත් මෙසේ නැවත අය කර ගෙන නොමැත.

- තව ද මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් විසින් පරිපාලන සමාගම්වලට දෙන ලද මුදල්වලින් නැවත අය කර ගෙන ඇත්තේ රු. මිලියන 1.3ක් පමණි.

- එසේම, එකී මර්කන්ටයිල් ක්‍රෙඩිට් සමාගම තවත් රාජ්‍ය බැංකු දෙකක් වන ලංකා බැංකුවට හා මහජන බැංකුවට ද විශාල මුදල් ප්‍රමාණයක් ණය වී ඇත. බැංකුවේ ණයකරුවන්ගේ ලැයිස්තුවේ සිටින්නේ ද මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් හි දැක්වෙන අධ්‍යක්ෂවරුන් ම ය.

## ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු සුපරීක්ෂණය හා බැංකු බලපත්‍ර නිකුත් කිරීම

➢ බැංකු බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධ නිර්ණායකයන් ද උල්ලංඝනය කරමින්, වාණිජ බැංකු පවත්වාගෙන යෑම සඳහා මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් හි එකී අධ්‍යක්ෂ මණ්ඩලයටම බලපත්‍ර නිකුත් කිරීමට පවා ශ්‍රී. ලං. ම. බැ. කටයුතු කර තිබේ. එකී නිර්ණායකයන් මෙසේය.

* ශක්තිමත් බැංකු ගණුදෙනු සඳහා හැකියාව
* ආර්ථිකයට ඇති ප්‍රතිලාභ / දායකත්වය
* අධ්‍යක්ෂ මණ්ඩලයේ හා ප්‍රවර්ධකයින්ගේ යෝග්‍යතාව
* ප්‍රධාන විධායක නිලධාරීන්ගේ හා අනෙකුත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ හැකියාව
* කාර්‍ය මණ්ඩලයට සැපයෙන පුහුණු පහසුකම්
* මූලික ප්‍රාග්ධනය සපයාගැනීමට ඇති"හැකියාව
* ව්‍යාපාර ප්‍රක්ෂේපණ ශාක්‍යතාවය
* බැංකු පනතේ අනෙකුත් අවශ්‍යතා හා අනුකූලවීම

➢ මෙවන් බලපත්‍රයක් 1989 දී සම්පත් බැංකුවට නිකුත් කළ අතර එහි අධ්‍යක්ෂ මණ්ඩලයට පහත සඳහන් අය ඇතුළත් වූහ.

* එන්. යූ ජයවර්ධන මයා - සභාපති
* නිහාල් ජයවර්ධන මයා - නියෝජ්‍ය සභාපති
* මිලින්ද මොරගොඩ මයා - අධ්‍යක්ෂ

1991 වසරේ සිදුවූ අයථා කළමනාකරණය හේතුවෙන් මෙම අධ්‍යක්ෂවරු ම සම්පත් බැංකුවේ එවකට කොටස්කරුවන් විසින් ඉවත් කරන ලදහ.

➢ 1994 දී බලපත්‍රය නිකුත් කරන ලද ම(ර්)කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ්හි අධ්‍යක්ෂකවරුන්ව සිටි ජාතික ව්‍යවසාය බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලයට පහත නම් සඳහන් අය ඇතුළත් වූහ

* එන්. යූ. ජයවර්ධන මහතා - සභාපති
* නිහාල් ජයවර්ධන මහතා - අධ්‍යක්ෂ

➢ පසුව 1999 දී ජාතික ව්‍යවසාය බැංකුව ප්‍රතිසංස්ථාපනය කරන ලද අතර මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් හි අධ්‍යක්ෂවරුන් වන පහත සඳහන් අධ්‍යක්ෂකවරුන්ගෙන් සමන්විත, සීමාසහිත ජාතික මර්කන්ටයිල් බැංකුව (නැෂනල් මර්කන්ටයිල් බෑන්ක් ලිමිටඩ්) යන නම යටතේ බලපත්‍රයක් ලබා ගන්නා ලදී.

* මිලින්ද මොරගොඩ මහතා - සභාපති
* නිහාල් ජයවර්ධන මහතා - නියෝජ්‍ය සභාපති

➢ 2000 මැයි 25 සිට 2000 ජූනි 29 දක්වා කාල පරිච්ඡේදය තුළ සිය නොස්ට්‍රෝ ගිණුම් වර්ධනය කරනු පිණිස විදෙස් විනිමය වෙළඳපලේදී විදේශ මුදල් මිලට ගැනීම, චාරිකා සහ ආනයන සඳහා විදේශ විනිමය විකිනීම, නේවාසික විදේශ මුදල් ගිණුම්වල සහ ආනයනකරුවන්ගේ විදේශ මුදල් ගිණුම්වල බැරට තැන්පතු භාර ගැනීම, සහ ණයවර ලිපි නිකුත් කිරීම ඇතුළුව විනිමය පාලන පනතට පටහැනිව එක්සත් ජනපද ඩොලර් 645,564ක් වන ගනුදෙනු සිදු කරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව, MERC බැංකුව නමින් ක්‍රියාත්මක ව පැවති මර්කන්ටයිල් බැංකුවට කවර හෝ දඬුවමක් පැනවීම අවශ්‍ය සේ නොසලකා හැර ඇති බව ඔබ කාරක සභාව නිරීක්ෂණය කළේය.

## ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය කාර්ය සාධනය

විගණකාධිපතිවරයාගේ වාර්තාව සහ පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද කාර්ය සාධන වාර්තාව පදනම් කරගෙන ඔබ කාරක සභාව, විස්තරාත්මක පරීක්ෂණයක් කරමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය කාර්ය සාධනය ද විමසුමට ලක් කළේය. ශ්‍රී ලංකා මහ බැංකුවේ ක්‍රියාකාරීත්වයන් පිළිබඳ දැඩි කනස්සල්ල පළ කරන කාරක සභාව, පාර්ලිමේන්තුවේ ක්ෂණික අවධානය යොමු විය යුතු කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට අදහස් කරයි.

විගණකාධිපතිවරයා සහ පොදුව්‍යාපාර දෙපාර්තමේන්තුව සිය වාර්තාවල පහත දැක්වෙන කරුණු අවධාරණය කර ඇත.

- යාවත්කාල කරන ලද ආයතනික සැලැස්මක් බැංකුවට නොතිබුණි.

- සමහර ලේඛන රහස්‍ය ඒවා වන බැවින් මුදල් නීති පනතේ රහස්‍යභාවය පිළිබඳ වගන්තියට ඇතුලත් වන්නේය යන හේතුව නිසා, විගණනය සඳහා ඒවා ලබා දී නොතිබුණු හෙයින් බැංකුව පිළිබඳ විගණන කටයුතු කිරීමේදී විගණනයේ විෂය පථයේ සමහර සීමා කිරීම් සිදු විය.

- තමා පාලනය වන්නේ මුදල් නීති පනතින් නිසා, රාජ්‍ය සංස්ථාවලට අදාළ වන පරිදි භාණ්ඩාගාරය විසින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛවලට එය බැඳී නැතැයි බැංකුව ප්‍රකාශ කර සිටී.

- රු. බිලියන 20 සිට රු. බිලියන 14.7 දක්වා මෙහෙයුම් ආදායමේ ද, රු. බිලියන 7.4 සිට රු. බිලියන 4.0 දක්වා දේශීය මූල්‍ය මෙහෙයුම් ආදායමේද අඩුවීම සලකන කල පසු ගිය වසර හා සැසඳීමේදී 2003 වසරේ සමස්ත ආදායම අඩු වූ අතර බැංකුවේ සමස්ත මෙහෙයුම් වියදම ඉහළ ගොස් තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් "ලාභ පැවරුම්" වශයෙන් ඒකාබද්ධ අරමුදලට කැරෙන දායකත්වයේ සැලකිය යුතු අඩු වීමක් සිදුවිය.

- සේවක සංඛ්‍යාව අඩු වෙමින් පවතිද්දී, සේවා නියුක්ති පිරිවැයේ සැලකිය යුතු ඉහල යෑමක් අසාමාන්‍ය ලෙස සිදු වී තිබුණි.

- රටට ලැබෙන අපනයන ආදායම් ප්‍රේෂණයන් සහ රටට අහිමි වන විදේශ විනිමය පිළිබඳ අධීක්ෂණයක් බැංකුව නොකළ නිසා, අපනයන ඉපැයුම් ප්‍රේෂණයන්හි අඩු වීමක් සිදු වී තිබේ.

- 2001, 2002 සහ 2003 වර්ෂ සඳහා පිළිවෙලින් රු. මි. 82.5 ක් ද, රු. මි. 44.6 ක් හා රු. මි. 67.9 ක් ද, වැය කරමින්, 2000 ජනවාරි 31 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛනය ද උල්ලංඝනය වන පරිදි බැංකුව සිය සේවකයින් වෙනුවෙන් උපයන විට ගෙවීමේ බදු (PAYE) ගෙවා තිබුණි.

- සිය අරමුදල් ආයෝජනය කිරීමෙන් අරමුදල විසින් උපයන ලද ආදායමට අමතරව, සැලකිය යුතු අතිරේක ගෙවීමක් කරමින් බැංකුව, ශ්‍රී ලංකා මහ බැංකුව කාර්ය මණ්ඩලීය අර්ථ සාධක අරමුදලට පොළි ගෙවා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සේ.අ.අ. දායක මුදල් ගෙවන්නන්ට වරණීය වශයෙන් දෙනු ලබන අනුපාතයට වඩා ඉහළ අනුපාතයක්, සිය සේ.අ.අ. ගිණුම් ශේෂ වෙනුවෙන් බැංකු සේවකයින්ට ගෙවනු ලැබේ.

- 1975 අංක 6 දරන සේ.අ.අ. (විශේෂ විධි විධාන) නීතියේ විධි විධාන උල්ලංඝනය වන පරිදි, 1996 පෙබරවාරි 1 දිනෙන් පසුව පවා බැංකුව සිය "ශ්‍රී ලංකා මහ බැංකු කාර්ය මණ්ඩලීය අර්ථ සාධක අරමුදලට" පොළී ගෙවීම් කරමින් තිබුණි. එසේම, බැංකු සේවකයින් සම්බන්ධයෙන් භාණ්ඩාගාරය විසින් නිර්දේශිත 8% ක අනුපාතය වෙනුවට 12% ක අනුපාතයක් සේවක දායක මුදල් වශයෙන් ගෙවා තිබුණි.

- ඉංජිනේරුවරයාගේ සැලසුම් අවසන් කිරීමේදී බැංකුවෙන් සිදු වූ ප්‍රමාදය හේතුවෙන් බැංකුව, "ගොඩනැගිලි පුළුල් කිරීම හා ගොඩනැගිලි පුනරුත්ථාපන ව්‍යාපෘති" වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට රු. මි. 626 ක් ගෙවා තිබුණි. ඒ අතර, ඇවර කරන ලද හානි වශයෙන් බැංකුව රු. මි. 90 ක් රඳවාගෙන තිබූ නිසා, කොන්ත්‍රාත්කරු රු. මිලියන 400ක් සඳහා හිමිකමක් ඉදිරිපත් කර තිබුණි.

- බැංකුවේ බලපත්‍රයක් ලබා නොගෙන මූල්‍ය ව්‍යාපාරවල නියැළීම 1998 අංක 78 දරන මුදල් සමාගම් පනතින් සමාගම්වලට තහනම් වුවද, එකී නෛතික විධිවිධානය උල්ලංඝනය කරමින් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන එබදු මූල්‍ය සමාගම් 30ක් පමණ තිබේ.

- ගිණුම්කරණ ඌනතා සහ නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම සලකන කල 2003 වසර සඳහා බැංකුවෙහි ගිණුම් පිළිබඳව ලබාදෙන ලද විගණන මතය, කොන්දේසි සහිත මතයක් විය.

ඔබ කාරක සභාවෙහි පොදු නිරීක්ෂන පහත දැක්වේ.

* ශ්‍රී ලංකා මහා බැංකුව මූල්‍ය සමාගම් අධීක්ෂණය කිරීමෙහි අසමත් වීම රටේ සාමාන්‍ය තැන්පත්කරුවන් හට බොහෝ දුෂ්කරතා ඇති වීමට තුඩු දී තිබේ.

* අසාර්ථක වූ මූල්‍ය සමාගම් වෙත ලබා දුන් විශාල ණය මුදල් ප්‍රමාණයන් ආපසු අය කර ගැනීමට අසමත් වීම.

* බැංකුවල කටයුතු පිළිබඳ ප්‍රමාණවත් අධීක්ෂණයක් නොමැති කම හේතුවෙන් ප්‍රමුඛ බැංකුවේ සිද්ධියේදී මෙන් කල් තියා වංචාව සහ අවකළමනාකරණය නිරීක්ෂණය ප්‍රමාණවත් පරිදි නොතිබීම.

* සඳහන් කරන ලද මූල්‍ය සමාගම් සහ බැංකු සමහරක් කඩා වැටීම කල්තියා සොයා ගැනීමෙන් සහ කාලෝචිත නිරීක්ෂණයෙන් වළකා ගත හැකිව තිබුණි.

* ශ්‍රී ලංකා මහා බැංකුව වෙත අය විය යුතු, රුපියල් මිලියන 7,263.3 කින් 60% කට වඩා ලැබිය යුතුවන්නේ මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් වෙතිනි.

* ශ්‍රී ලංකා මහ බැංකුවෙහි සමස්ත ආදායම සහ ලාභවල පහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස ඒකාබද්ධ අරමුදල වෙත කෙරෙන ශේෂ ලාභය පැවරීමෙහි පහළ යාමක් ඇති විය.

* අපනයන ප්‍රේෂණයන් පිළිබඳව නිසි අධීක්ෂණයක්, නොමැතිකම හේතුවෙන් රටෙහි බාහිර සම්පත් ක්ෂය වෙමින් පවතින චකවානුවක අපනයන ආදායම් පූර්ණ ලෙස ශ්‍රී ලංකාව තුළට නොපැමිණීම.

* බැංකුව විසින් පවත්වා ගෙන යනු ලබන පෞද්ගලික අර්ථසාධක අරමුදල් වෙත සේවක අර්ථසාධක අරමුදලේ දායකත්ව මුදල් ගෙවීම, සේවක අර්ථසාධක අරමුදල් නීතියට පටහැනිව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී.

අවසන් වශයෙන් ඔබ කාරක සභාව පහත සඳහන් කරුණු නිර්දේශ කරයි.

* ආසාර්ථක වූ මූල්‍ය සමාගම් වෙත දෙන ලද අත්තිකාරම් ආපසු අය කර ගැනීම කඩිනම් කරනු පිණිස වහාම ක්‍රියාමාර්ග ගත යුතුය.

* ශ්‍රී ලංකාව වෙත අපනයන ආදායම් ගෙන නොඒම පිළිබඳ විමර්ශනයන් සිදු කොට, විදේශ සම්පත් හීන වීම වළකනු පිණිස උචිත පරිදි ප්‍රතිකර්ම යෙදිය යුතුය.

* කාර්යමණ්ඩල කළමනාකරණය කාර්යක්ෂම කොට සේවක අර්ථසාධක අරමුදල් දායකත්වයන් විධිමත් කළ යුතුය.

* ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ආයතන පිළිබද අධීක්ෂණ කාර්යභාරය ශක්තිමත් කරනු පිණිස නිතිපතා නිරීක්ෂණයත් උචිත ක්‍රම හා වෘත්තියවේදී ප්‍රමිතීන් අනුගමනයත් ඇති කළ යුතුය.

* මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් සහ ආශ්‍රිත සමාගම්වල පරිපාලිත සමාගම්වලට එරෙහිව ගත යුතු සියලු ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරනු පිණිස විශේෂ ස්වාධීන ඒකකයක් ඇති කළ යුතුය.

* ශ්‍රී ලංකා මහ බැංකුවෙහි බැංකු හා බැංකු-නොවන ආයතන අධීක්ෂණය කිරීමෙහි කාර්යභාරය නිසි පරිදි ඉටුකිරීම සඳහා අවශ්‍යවන නීතිමය රාමු සැකැස්ම සහ නීතිමය විධිවිධාන ශක්තිමත් කළ යුතුය.

* වැඩි වෙමින් පවතින මූල්‍ය ආයතන සහ වාණිජ බැංකු සංඛ්‍යාව හමුවේ ශ්‍රී ලංකා මහ බැංකුවෙහි කාර්යභාරයෙහි වත්මන් අවශ්‍යතා සපුරාලිය හැකි නිපුණ සේවකයන්ගෙන් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි නීති දෙපාර්තමේන්තුව ශක්තිමත් කොට මූල්‍ය මණ්ඩලයෙහි බැංකු සහ බැංකුනොවන අංශයේ මූල්‍ය ආයතනවල කටයුතු ආශ්‍රිත අරමුදල් සම්බන්ධ අධීක්ෂණ කාර්යභාරය සඳහා ප්‍රමාණවත් කාලයක් කැප කිරීමට එම මණ්ඩලයට හැකි වන සේ එම මණ්ඩලයේ රැස්වීම් විධිමත් කළ යුතුය.

* ශ්‍රී ලංකා මහ බැංකුවේ විෂයපථය යටතට දැන් ඇතුළත් වන සියලු කාරණා නිශ්චය කරනු පිණිස මූල්‍ය මණ්ඩල සාමාජිකයින් විසින් ගත කරනු ලබන කාලය ඔවුනට ප්‍රමාණවත් නොවන බව ඔවුන් පවසා ඇති නිසා තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහි ප්‍රමාණවත් පරිදි නිරත වීමට මූල්‍ය මණ්ඩලයට හැකි වීම පහසු කරවනු පිණිස අවශ්‍ය වන ධාරිතාව ඇති කිරීම කළමනාකරණයේ වගකීම වෙයි.

* මූල්‍ය ශක්තිය හීනවූ මූල්‍ය සමාගම් වෙතින් ආපසු අය කිරීම උපරිම කෙරෙන බවට වග බලා ගනු පිණිස එම ආයතනවල වත්කම් විකුණා දැමීම වහාම නවත්වනු ලබන බවට වගබලා ගනු පිණිස ක්‍රියාමාර්ග යෙදිය යුතුය.

* ආයතනවල පරිහානියට වගකිවයුතු පුද්ගලයින් පිළිබදව ණය තොරතුරු කාර්යාංශයට දැනුම් දෙනු ලබන බවට වගබලා ගත යුතුය.

* වත්මන් වාණිජ පරිසරය තුළ දැනට පවත්නා නීතිරීති ප්‍රමාණවත් නොවන බවත්, එබැවින් ජාත්‍යන්තර හා දේශීය අවශ්‍යතාවලට අනුකූල වන පරිද්දෙන් දැනට පවත්නා යල් පැන ගිය නීතිරීති සැකසිය යුතු බවත් ඉතා පැහැදිලිව පෙනී යයි.

* බැංකු සහ බැංකු-නොවන අංශයෙහි විවිධ ක්ෂෙත්‍ර තුළ පොදු ජනතාවගේ තැන්පතු එකතු කර ගැනීම සඳහා කවර ආකාරයේ හෝ උපකරණ (ලියැවිලි) හෝ යෝජනාක්‍රම දියත් කරනු ලැබූ අවස්ථාවන් පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව පාර්ලිමේන්තුව වෙත ත්‍රෛමාසික වාර්තාවන් ඉදිරිපත් කළ යුතුය.

* විනිමය පාලන දෙපාර්තමේන්තුව සිය අධීක්ෂණ සහ නිරීක්ෂණ කාර්යභාරයෙහි රාජකාරි අත් හැරියේ මන්ද යන්න පිළිබඳව ඔවුන්ගෙන් ප්‍රශ්න කළ යුතු අතර මර්කන්ටයිල් බැංකුව සහ සී/ස ප්‍රමුඛ බැංකුව සිද්ධියේදී මෙන් අදාල ආයතනයට හෝ පුද්ගලයින්ට එරෙහිව ක්‍රියාත්මක වීමට උපදෙස් දිය යුතුය.

* ශ්‍රී ලංකා මහා බැංකුව විසින් මුදල් දෙන ලදුව, දැනට ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පවරා ඇති මූල්‍ය සමාගම් සම්බන්ධයෙන් වන ශ්‍රී ලංකා මහ බැංකුව ලබා දුන් එම අත්තිකාරම් පිළිබඳ අයිතිවාසිකම් ආරක්ෂා කෙරෙන බවට වග බලා ගනු පිණිස ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජිතයින් සහ අධ්‍යක්ෂවරුන් පත් කිරීමට වහාම පියවර ගත යුතුය.

* 1992-2004 කාල පරිච්ඡේදය තුළදී, ශ්‍රී ලංකා මහා බැංකුවෙහි සමස්ත වගකීමට පාත්‍ර වන වැදගත් ක්ෂෙත්‍රයන්හි අධීක්ෂණය, පරිපාලනමය වශයෙන් සහ සමස්ත කාර්යසාධන අංශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි සමස්ත වගකීම්වලින් අපේක්ෂිත ආකාරයෙන් සිදු වී නොමැති බව කාරක සභාව නිරීක්ෂණය කරයි.

* ශ්‍රී ලංකා මහා බැංකුව සිය කළමනාකාරිත්වය සහ එහි සමස්ත වගකීම් සම්බන්ධයෙන් සිය කාර්යසාධනය වැඩිදියුණු කරනු පිණිසත් එහි දිශාව නිවැරදි කරනු පිණිසත් යම් ක්‍රියාමාර්ග සහ පියවර ගෙන ඇති බව කාරක සභාව සටහන් කරයි.

* 2005 සිට මූල්‍ය මණ්ඩලයේ ප්‍රගතිය පිළිබඳවත් මෙහිදී කරන ලද නිරීක්ෂණ සහ නිර්දේශ අනුගමනය කරනු පිණිස යොදන ලද පියවර පිළිබඳවත් 2005 දෙසැම්බර් මස වන විට එම මණ්ඩලය විසින් ඉදිරිපත් කිරීමට නියමිත වාර්තාව කාරක සභාව අපේක්ෂා කරයි.

* තවද, බැංකු සහ බැංකු නොවන අංශ භාරව සිටි අදාළ නිලධරයන් විසින් 1991 සිට 2005 දක්වා කාලපරිච්ඡේදය තුළදී, ඉහත ගෙන හැර දක්වන ලද කාරණා ආශ්‍රිතව දක්වන ලද ඌනතාවන් සම්බන්ධයෙන් පුද්ගලයින්ගේ ක්‍රියාකලාපය පිළිබඳ සවිස්තර වාර්තාවක් මූල්‍ය මණ්ඩලය සමගින් මුදල් අමාත්‍යංශය විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු යැයි ඔබ කාරක සභාව අදහස් කරන අතර, මූල්‍ය මණ්ඩලය විනය සහ අනෙකුත් ආශ්‍රිත ක්‍රියාකාරිත්වයන්, අතින් ඔවුන්ගේ අසාර්ථකත්වය සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය අවශ්‍ය පියවර ගත යුතුය.

| | | |
|---|---|---|
| COPE | – | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව |
| CBSL | – | ශ්‍රී ලංකා මහා බැංකුව |
| MCL | – | සීමාසහිත මර්කන්ටයිල් ක්‍රෙඩිට් සමාගම |
| MLCF | – | මධ්‍යම සහ දීර්ඝකාලීන ණය අරමුදල |
| PML | – | සීමාසහිත ප්‍රිමියර් මැනිජ්මන්ට්ස් |
| C & L | – | කූපර්ස් ඇන්ඩ් ලයිබ්‍රැන්ඩ් ඇසෝසියට්ස් |
| CEO | – | ප්‍රධාන විධායක නිලධාරී |
| PAYE | – | උපයන විට ගෙවීම |
| EPF | – | සේවක අර්ථ සාධක අරමුදල |
| VRS | – | ස්වේච්ඡා විශ්‍රාම යෝජනා ක්‍රමය |
| AIL | – | සීමාසහිත ඇලයිඩ් ඉන්වෙස්ට්මන්ට්ස් |

## ශ්‍රී ලංකා මහ බැංකුව සම්බන්ධයෙන් පැවති සාකච්ඡා සඳහා පොදු: ව්‍ය: කා: ස: වට සහභාගිවූ නිලධාරීන්ගේ නම් සහ තනතුරු නාමයන්

| අංකය | නම | තනතුර |
|---|---|---|
| 01 | සුනිල් මෙන්ඩිස් මහතා | අධිපති |
| 02 | ඩබ්. ඒ. විජේවර්ධන මහතා | නියෝජ්‍ය අධිපති |
| 03 | ආචාර්ය ආර්. ජයමහ මහත්මිය | නියෝජ්‍ය අධිපති |
| 04 | සී. චන්මුගම් මහතා | මුදල් මණ්ඩල සාමාජික |
| 05 | තිලක් ද සොයිසා මහතා | මුදල් මණ්ඩල සාමාජික |
| 06 | පී. ඩී. රොද්‍රිගො මහතා | මුදල් මණ්ඩල සාමාජික |
| 07 | සී. අබේනායක මහත්මිය | අධිපතිගේ සහකාර |
| 08 | එම්. ඒ. ආර්. සී. කුරේ මහත්මිය | සහකාර අධිපති |
| 09 | ආචාර්ය ඒ. ජී. කරුණාසේන | සහකාර අධිපති |

| අංකය | නම | තනතුර |
|---|---|---|
| 10 | වයි. එම්. ඩබ්. බී. වීරසේකර මහතා | සහකාර අධිපති |
| 11 | පී. ඩී. ජේ. ප්‍රනාන්දු මහතා | සහකාර අධිපති |
| 12 | කේ. ජී. ඩී. ඩී. ධීරසිංහ මහතා | සහකාර අධිපති |
| 13 | ආර්. ඒ. ජයතිස්ස මහතා | සහකාර අධිපති |
| 14 | එච්. ඒ. ජී. හෙට්ටිආරච්චි මහතා | විනිමය පාලක |
| 15 | එච්. එම්. පී. හේරත් මහතා | අතිරේක විනිමය පාලක |
| 16 | පී. එල්. එස්. කේ. පෙරේරා මහතා | නියෝජ්‍ය විනිමය පාලක |
| 17 | එස්. කදුරුගමුව මිය | අධ්‍යක්ෂ/නීති |
| 18 | ආචාර්ය එච්. එන්. තේනුවර | අධ්‍යක්ෂ/ආර්ථික පර්යේෂණ |
| 19 | ඩී. එල්. කටුවාවල මහතා | ප්‍රධාන ගණකාධිකාරී |
| 20 | සී. ප්‍රේමරත්න මිය | අධිකාරි/රාජ්‍ය ණය |
| 21 | එස්. විජේසිංහ මහතා | හිටපු ව්‍යවහාර මුදල් අධිකාරි |
| 22 | පී. සමරසිරි මහතා | අතිරේක අධ්‍යක්ෂ/බැංකු අධීක්ෂණ |
| 23 | ජේ. ඒ. එන්. දිසානායක මහතා | අතිරේක අධ්‍යක්ෂ/කළමනාකාරිත්ව විගණන |
| 24 | එස්. එස්. රත්නායක මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ/බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ |
| 25 | ඒ. ජීවන්දර මහතා | ව්‍යවහාර මුදල් අධිකාරි |
| 26 | ඒ. එස්. ජයවර්ධන මහතා | හිටපු අධිපති |
| 27 | ජේ. සී. ටී. ද සිල්වා මහත්මිය | අධ්‍යක්ෂ/බැංකු අධීක්ෂණ |
| 28 | ඒ. ඒ. හෙට්ටිආරච්චි මහත්මිය | අතිරේක ප්‍රධාන ගණකාධිකාරී |
| 29 | ඒ. ආර්. එම්. අසාඩ් මහතා | නීති නිලධාරි |
| 30 | එල්. කේ. ගුණතිලක මහත්මිය | අධ්‍යක්ෂ/බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ |
| 31 | ආචාර්ය එන්. එල්. සිරිසේන | හිටපු අධ්‍යක්ෂ/බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ |